# පිටකත්‍රය පයර්‍යාය නාම සංග්‍රහය

අතිපූජ්‍ය කොටනෙළුවේ චන්ද්‍රජෝති නාහිමි

දෙසනා සාසනකථා, භෙදං තෙසු යථාරහං
සික්ඛාප්පහාණ ගම්භීර, භාවඤ්ච පරිදීපයෙ

පරියත්ති භෙදං සම්පත්තිං — විපත්තිං චාපි යං යහිං
පාපුණාති යථා භික්ඛු — තම්පි සබ්බං විභාවයෙ

(දීඝනිකායට්ඨකථා 14 වෙනි පිට)
(සමන්තපාසාදිකා 10 වෙනි පිට)

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය කොටස් තුනකට බෙද ඒ කොටස් තුනට සුදුසු පරිදි නම් තබා "ත්‍රිපිටකය," "තුන්පිටකය," "පිටකත්‍රය," යනු වශයෙන් ව්‍යවහාර කරන බව සුප්‍රකට කරුණකි. මෙකී පිටක නාමයට අමතරව ඒ ඒ එක එක පිටකයට තවත් වෙන වෙන නාම ව්‍යවහාරයන් ශාසනිකයන් අතර පැවැතුණු බව ප්‍රකාශ කිරීම මේ ලිපියෙන් අදහස් කෙරේ. "දෙසනා" යන්නෙන් නිම වන වචන තුනකින් ද තුන් පිටකය හඳුන්වනු ලැබේ. ඒ මෙසේයි :— ආණාදෙසනා, වොහාරදේසනා, පරමත්ථදේසනා කියායි. ආණාදේසනා — විනය පිටකයයි. වොහාරදේසනා — සුත්තන්ත පිටකයයි. පරමත්ථදේසනා — අභිධම්ම පිටකයයි. "සාසන" යන්නෙන් නිමවන වචන තුනක් ද ත්‍රිපිටකය හඳුන්වන්නට යොදගෙන ඇත, ඒ මෙසේයි. "යථාපරාධ සාසන, යථානුලොම සාසන, යථාධම්ම සාසන" කියායි. යථාපරාධ සාසන නම් වන්නේ (භික්ෂූන් කළ කළ වරද අනුව පැනවූ ශික්ෂාපදවලින් යුත්) විනය පිටකයයි. යථානුලොම සාසන නම් වන්නේ (ලෙව්හි එන ව්‍යවහාරවලට අනුව දෙසූ) සුත්තන්ත පිටකයයි. යථාධම්ම සාසන නම් වන්නේ (ධර්ම පුඤ්ජයන් කෙරෙහි ආත්මත්වයෙන් ගත් අදහස්වලට පටහැනි) අභිධර්ම පිටකයයි. 'කථා' යන්න අගට එන නම් තුනක් ද තුන් පිටකයට පිළිවෙළින් ඇත. ඒ මෙසේයි. "සංවරාසංවර කථා, දිට්ඨිවිනිවෙඨන කථා, නාම රූප පරිච්ඡෙද කථා" කියායි. මේ ත්‍රිපිටකය "සික්ඛා" යන්නෙන් නිම වන වචන තුනකින් ද පැවසේ. ඒ මෙසේයි. "අධිසීල සික්ඛා, අධිචිත්ත සික්ඛා, අධිපඤ්ඤා සික්ඛා" කියායි. මේ එක පිටකයක ඇසුරෙන් සිදුවන ක්ලේශ ප්‍රහාණයන් වශයෙනුත් නම් තුනක් ලැබේ. විනය — වීතික්කමප්පහාණ නම්. සුත්තන්තය පරියුට්ඨානප්පහාණ නම්. අභිධර්මය අනුසයප්පහාණ නම්. තවද විනය—දුච්චරිත සංකිලෙසප්පහාණ' කියාත් සුත්තන්තය—තණ්හා සංකිලෙසප්පහාණ කියාත්, අභිධර්මය දිට්ඨිසංකිලෙසප්පහාණ කියාත් ප්‍රකාශිතයි. කෙලෙස්වල තදඞ්ගප්පහාණ වික්ඛම්භනප්පහාණ සහ සමුච්ඡේදප්පහාණ සඳහාත් මේවා උපකාර වන බව කියා තිබේ. සීලය ව්‍යතික්‍රමයටත්, සමාධිය පරියුට්ඨානයටත්, ප්‍රඥාව අනුශයවලටත් විරුද්ධයි. ප්‍රහාණ දක්වා තිබෙන්නේ ඒ අනුවයි.

### ගම්භීර භාවය

මෙකී ත්‍රිපිටකයන් පිළිබඳ ගැඹුරුකම කියමින් ධම්මගම්භීර, අත්ථගම්භීර, දෙසනාගම්භීර පටිවේධගම්භීර කියා චතුරාකාරයක් පවසා ඇත. "ධර්මය මේය අර්ථය මේය" ආදි වශයෙන් හේතු හා හේතු ඵලයන් දැනෙන්නේ පින් ඇති අයටයි. ඒවා ගැන සිතා පුහුණු කළ පෙර පුරුද්ද ඇති අයටයි. නැති අයට ඒවා ගැඹුරුයි. එසේ නම් දෙසීමත් අසීරුයි. පින හා පළපුරුද්ද ඇති අයට නම් තමා දත් දෙය අනුන්ට වැටහෙන්ට කියා දීම පිණිස ඊට නිසි පද වැළ සැදී ඇදී එනු සිදු වෙයි. අසන්නාත් පිනැතියෙක් නම් ඒ දෙසුම අසා කාරණය වටහා ගනී. එබැවින් පිනැතියන්ට මේ හැම ගැඹුරු නැතම

නොගැඹුරුයි. උත්තානයි. ඒ බව ලැබගන්නා සඳහා කැමැත්තෙන් ඕනෑකමින් ඉගනීම කළයුතු වෙයි. නැති නම් එම ගැඹුරුකම් නිසා තමා සසර සයුරේ ගැලෙනු මිස එතෙර වනු සිදු නො වෙයි. උත්සාහ කරන්නන්ට උත්සාහයේ ප්‍රතිඵල වශයෙන් එම සසරින් එතරවන පහසුකම ලැබෙයි. එබැවින් උත්සාහ කළයුතු වෙයි. නිර්දේශ කළ ගාථාවන්ගෙන් ප්‍රථම ගාථාවට අයත් කරුණු පවසා නිමවූ හෙයින් දැන් කියන්නේ දෙවෙනි ගාථාවේ කරුණුයි.

එහි මුලින්ම එන්නේ පරියත්ති භේදයි. එය ත්‍රිවිධයි. " අලගද්දූපමා පරියත්ති, නිස්සරණත්ථා පරියත්ති, භණ්ඩාගාරික පරියත්ති " වශයෙනි. අලගද්දූපම වන්නේ ත්‍රිපිටකය වැරදි ලෙස ඉගනීම සහ උගත් බණ නුහුරට පාවිච්චි කිරීම පරාර්ථය වෙනුවට ආත්මීයාර්ථ සිද්ධිය පිණිස භාවිත කිරීම වැරදි විධියට නයා ඇල්ලීම වැනි විපත්තිදායක දෙයකි. පිළිපැදීමේ රිස්සෙන් ඉගැනීමත්, මතක තබා ගැනීමත්, පිළිපැදීමත්, ඉගැන්වීමත්, නිස්සරණාර්ථ වෙයි. රහතුන් වහන්සේලා ත්‍රිපිටකය හදරන්නේ ත්‍රිපිටකය අනුන්ගේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කිරීමටයි.

**සම්පත්ති**

සීල සම්පත්තිය ත්‍රිවිද්‍යාවන් ලැබෙන්ට මහ පාදයි. විනය නිස්සිත සුත්තන්ත සාධිත සමාධිය ෂඩභිඥාවන්ට මහ පාදයි. අභිධම්මාභිසිද්ධ ප්‍රඥා සම්පත්තිය සිව්පිළිසිඹියා ලැබීමට මහ පාදයි.

මෙසේ ත්‍රිපිටකයෙන් නැගෙන සීල සමාධි ප්‍රඥා සම්පත්ති තදුත්තර සම්පත්තිය වන මුක්තිය සිද්ධ කෙරේ.

සිල්වතුන්ට කැපසරුප් ආසන සුව පහසු දැනෙන ඒවා වුවත් පාවිච්චි කරන්ට හොඳ නම් උපාදින්න එස්සාදියත් නිවරද යයි ගත් මිථ්‍යා විශ්වාසය නිසා සමහරු නොමග ගොස් මාගමුන්ගේ පහස පවා නොවරදයි සිතති. එයින් විපතට වැටෙති. සසර වඩති. දුකින් නොමිදෙති. ඒ ත්‍රිපිටකය ඔස්සේ එන විපත්ති මාර්ගයයි.

මෙකී කරුණු සැලකිල්ලට ගෙන බුද්ධිමත්හු ත්‍රිපිටකයේ නිසි දැනුම ලබා නිසිසේ පිළිපැද හිත වැඩ සාධාගනිත්වා.

---

"ඔබ ඔබ රටෙහි පාලකයන් විය යුතුය. ඔබ ඔබට ගැළපෙන ලෙස ජීවිතය සකස්කර ගත යුතුය. එය ඔබේ අයිතිවාසිකමකි."

(ව්ලැඩිමීර් අයි ලෙනින්)

---